නෙත් FM

# 5 පහේ පන්තිය

★ **අංක 01 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ශාක පත්‍ර යොදා ගෙන තම කූඩුව නිර්මාණය කරන කෘමියා කවුරුන් ද?

(1) වේයා (2) දිමියා (3) මී මැස්සා

02 හූනන්ට ගමන් කිරීමේ දී ලැබී ඇති විශේෂ වාසිය කුමක් ද?

(1) වේගයෙන් ගමන් කළ හැකි වීම

(2) පැන පැන යා හැකි වීම

(3) පෘෂ්ඨයකට ඇලී සිටීම සඳහා විශේෂ පාද තිබීම

03 තද අරටුවක් සහිත දැවමය වටිනාකමක් ඇති ශාකය වන්නේ මින් කුමක් ද?

(1) කැන්ද (2) කොට්ට පුළුන් (3) කොස්

04 ලංකාවට ආවේණික ඒක දේශීය ශාකයක් වන්නේ මින් කුමක් ද?

(1) මහෝගනි (2) හීං බෝවිටියා (3) කොස්

05 පාසලේ දී ඇතැම් අයගේ වැරදි පුරුදු අන් අයගේ ද සෞඛ්‍යයට හානි කර ලෙස බලපාන අවස්ථාවක් වන්නේ මින් කුමක් ද?

(1) කෑම කන විට තලු ගැසීම

(2) වැසිකිළි කැසිකිළි භාවිතයෙන් පසු නිසි පරිදි පිරිසිදු නොකිරීම

(3) ක්‍රීඩා කිරීම සඳහා වැඩි කාලයක් ගත කිරීම

06 කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා සුදුසු ම ක්‍රමය වන්නේ මින් කුමක් ද?

(1) වෙහෙස නොබලා දිගට ම වැඩ කිරීම

(2) කාල සටහනකට අනුව සැලසුම් සහගත ව වැඩ කිරීම

(3) උපරිම වේගයෙන් වැඩ කිරීම

**07** පොදු ප්‍රවාහන සේවා භාවිතයේ දී නොකළ යුතු දෙයක් වන්නේ මින් කුමක් ද?

(1) පෝළිමේ සිට බස්රියට, දුම්රියට ගොඩ වීම

(2) යන ගමනට වලංගු ප්‍රවේශ පතක් ලබා ගැනීම

(3) වාහනයේ කුණු නොදමා ඒවා වාහනයෙන් පිටතට විසි කිරීම

**08** දකින විට පන්සලක් බෝධියක් පිළිමයක්
හුනස්නෙන් නැගිටිමින් වඳිනවා......................... යන මාලනී බුලත්සිංහල මහත්මිය ගායනා කරන ගීතයෙන් කියවෙන්නේ කුමක් ගැන ද?

(1) පොදු ප්‍රවාහන සේවා භාවිත කරන අයගේ යහපත් හැසිරීම

(2) පොදු ප්‍රවාහන සේවා භාවිත කරන ඇතැම් අයගේ ආත්මාර්ථකාමී හැසිරීම

(3) පොදු ප්‍රවාහන සේවා භාවිතයේ වටිනාකම

**09** මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ සංකේතවත් කිරීම සඳහා ජාතික කොඩියේ යොදා ඇති සංකේතය කුමක් ද?

(1) සිංහයාගේ කකුල් හතර

(2) හතර වටේ ඇති කහ පාට තීරුව

(3) හතර කොණේ යොදා ඇති බෝ කොළ හතර

**10** ඌව පළාතේ නගරයක් කේන්ද්‍ර කරගෙන පවත්වනු ලබන විශේෂිත ආගමික උත්සවය කුමක් ද?

(1) කතරගම පෙරහැර (2) දළඳා පෙරහැර (3) මිහිඳු මහා පෙරහැර

**11** අලුදෙණියේ බණ්ඩා, දොන් පුල්ලේ වෙදරාල යන නම්වලින් ද හැඳින්වුණු නිදහස් සටන වෙනුවෙන් කැප වූ ජාතික වීරවරයා කවු ද?

(1) ගොංගාලේගොඩ බණ්ඩා (2) වීර පුරන්අප්පු (3) උතුවන් කන්දේ සරදියෙල්

**12** සමබල ආහාර වේලක් අපගේ සිරුරට ඉතා අවශ්‍ය ය. එසේ නොවුණහොත් සිදුවිය හැකි බලවත් ම හානිය මින් කුමක් ද?

(1) ශරීරයට අවශ්‍ය ශක්තිය නොලැබීම

(2) ශරීර වර්ධනය අඩාල වී ලෙඩ රෝග වැළඳීම

(3) නිතර නිතර බඩගිනි ඇති වීම

**13** ආදිවාසීන් මස් කල් තබා ගැනීම සඳහා භාවිත කළ ක්‍රමයක් වන්නේ මින් කුමක් ද?

(1) වැලි යට දැමීම (2) ඇඹුල් තියල් දැමීම (3) මී පැණිවල බහා තැබීම

**14** සුළඟින් ක්‍රියා කරවන භාණ්ඩයක් නොවන්නේ මින් කුමක් ද?

(1) සුළං පෙත්ත (2) බඹරය (3) සරුංගලය

**15** ගංවතුර, නායයාම්වල දී එම තත්ත්වයන්ට ලක් වූ අයට සහන සැලසීම සඳහා විශේෂයෙන් පිහිටුවා ඇති ආයතනය කුමක්ද?

(1) පොලීසිය (2) ගිනි නිවන හමුදාව (3) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**16** ජලය ආශ්‍රිත ව ක්‍රියා කරන, වගාව සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ගොවියා විසින් යොදා ගන්නා උපකරණය වන්නේ මින් කුමක් ද?

(1) කැටපෝලය (2) දිය හොල්මන (3) ටකය

**18** ජල වාෂ්ප යොදා ගෙන සිදු කරන කාර්යයක් නොවන්නේ මින් කුමක් ද?

(1) ඉඳි ආප්ප, පිට්ටු තම්බා ගැනීම

(2) දේශීය ඖෂධ වර්ග තම්බා ගැනීම

(3) වායු බැලුන ක්‍රියාත්මක කිරීම

**19** ඇතැම් රූපවාහිනී ප්‍රවෘත්ති විකාශනවල දී තිරයේ පැත්තකින් සංඥා භාෂාව මගින් ප්‍රවෘත්ති ඉදිරිපත් කරනු ලබන අයෙකුගේ දර්ශනයක් දැක ගත හැකි ය. ඒ කා සඳහා ද?

(1) ශ්‍රවණාබාධිත අය සඳහා (2) දෘශ්‍යාබාධිත අය සඳහා (3) සියලුම ආබාධිත අය සඳහා

ලිපියක් තැපැල් කිරීමේ දී එයට ගාස්තුව ගෙවිය යුත්තේ කුමක් අනුව ද?

(1) ලිපිය යවන දුර අනුව (2) යවන ලිපියේ බර අනුව (3) යවන ලිපියේ දිග පළල අනුව

**20** කසළ බැහැර කිරීමේ දී සාමාන්‍ය ආකාරයට බැහැර කළ නොහැකි කසළ වර්ගය වන්නේ මින් කුමක් ද?

(1) දිරා යන ශාක කොටස් (2) දිරා නොයන දේ (3) විද්‍යුත් අපද්‍රව්‍ය


**21** බල්ලන්, බළලුන් වැනි සතුන් ඇති කරන අය අතරින් සමහර පුද්ගලයන් කරන වරදක් වන්නේ මින් කුමක් ද?

(1) ඔවුන් කූඩු කර තැබීම

(2) ඔවුන් ව තමන් යන එන තැන්වලට රැගෙන යාම

(3) පොදු ස්ථානවල ඔවුන් ව අතහැර දමා යාම

**22**




- මෙහි A භාජනයේ නටන තෙක් රත් කර නිවා ගත් ජලයට මෑ බීජ දමා උඩින් පොල් තෙල් තට්ටුවක් යොදා ඇත.
- B භාජනයේ උණු කර නිවා ගත් ජලයට මෑ බීජ දමා ඇත.

මෙම පරීක්ෂණය මගින් සොයා බැලිය හැක්කේ බීජ පැළවීම කෙරෙහි කුමන සාධකයක බලපෑම ද?

(1) වාතයේ (2) උෂ්ණත්වයේ (3) ජලයේ


**23** රසායනික පොහොර භාවිතය නිසා සිදුවන ප්‍රධාන ම අවාසිය වන්නේ මින් කුමක් ද?

(1) අස්වැන්න වැඩි වීම

(2) ඒවා භාවිතය සඳහා මුදල් වැය වීම

(3) පාංශු ජීවීන්ට හානි වී පස නිසරු වීම

**24**



මෙම උපකරණය මගින් සිදු කෙරෙන ප්‍රධාන ම කාර්යය වන්නේ,

(1) යමක් තැලීම

(2) යමක් කැබලිවලට කැඩීම

(3) යමක් සිරකර ස්ථාවර ව තබා ගැනීම

**25** අතීතයේ දී ධාන්‍ය වර්ග ඇඹරීම සඳහා භාවිත කළ උපකරණය මින් කුමක් ද?

(1) වංගෙඩිය (2) කුරහන් ගල (3) සකපෝරුව

**26** මිනිස් අවශ්‍යතා මත භූමිය වෙනස් කිරීම නිසා සිදුවන අවාසියක් වන්නේ මින් කුමක් ද?

(1) ගමනාගමනය පහසු වීම (2) ඉදිකිරීම් කටයුතු පහසු වීම (3) නාය යෑම් සිදුවීම

**27** රාත්‍රි කාලයේ පිපෙන මලක් වන්නේ මින් කුමක් ද?

(1) සේපාලිකා මල් (2) වද මල් (3) අරලිය මල්

**28** නිවසක ඇති විදුලි බල්බයක් ගැලවීමට පෙර අනිවාර්යයෙන් ම කළ යුතු වන්නේ මින් කුමක් ද?

(1) බල්බය දැවී ඇත්දැයි ස්ථිර ව ම සොයා ගැනීම

(2) බල්බය ගැලවීමට පෙර ප්‍රධාන පරිපථ යොමුව ක්‍රියා විරහිත කිරීම

(3) රෙදි කැබැල්ලක් භාවිත කර බල්බය ඇල්ලීම

**29** ලුණු ලේවායක දී ලුණු නිපදවීම සඳහා යොදා ගන්නේ කුමන ජලය ද?

(1) කිවුල් ජලය (2) මිරිදිය (3) මුහුදු ජලය

**100** චුම්බකයක වැඩි ම ආකර්ෂණ බලයක් ඇත්තේ,

(1) උතුරු ධ්‍රැවයේ ය. (2) දකුණු ධ්‍රැවයේ ය. (3) එම ධ්‍රැව දෙකේ ම ය.